මාසික

විවරණිකාව

2009 මැයි

ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව

විවරණිකාව

59 වැනි වෙළුම 5 වැනි කලාපය

2009 මැයි

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

ISSN 1391 - 3654

ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.

පටුන				පිටුව
1 වන කොටස - මාසික සිදුවීම් - 2009 මැයි	....	....	....	05
2 වන කොටස - පුවත්පත් නිවේදන - 2009 මැයි	....	....	....	06
1. පොලී අනුපාත අඩු කිරීම	....	....	....	06
2. 2009 මාර්තු මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය			....	06 - 08
3. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2009 මැයි		....	....	09
4. S&P ආයතනය විසින් ශ්‍රී ලංකාවේ දැක්ම සඳහා වූ ශ්‍රේණිගත කිරීම පහළ දැමීමට ගත් තීරණය කණගාටුදායක වේ			....	10
5. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) 2007,2008 සහ 2009				11

1 වන කොටස

මාසික සිදුවීම්

2009 මැයි

ආහාර සහ කෘෂිකර්ම සංවිධානය හරහා ස්පාඤ්ඤය රජයෙන් ලැබුණු ප්‍රදානය

දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් සඳහා ප්‍රාදේශීය ධීවර වෘත්තීන් ඇති කිරීමේ වැඩසටහන සඳහා යොදා ගැනීමට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 19.549 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 2,246) ක ප්‍රදානයක් සඳහා ශ්‍රී ලංකා රජය සහ ස්පාඤ්ඤය රජය අතර ගිවිසුමකට 2009 මැයි 22 වැනි දින අත්සන් තබන ලදී. කාම්බෝජය, ඉන්දුනීසියාව, පිලිපීනය, ශ්‍රී ලංකාව, ටිමෝරය සහ වියට්නාමය මෙම වැඩසටහනට සහභාගි වන අනෙකුත් රටවල් වේ.

2 වන කොටස
පුවත්පත් නිවේදන
2009 මැයි

1. පොලී අනුපාත අඩු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑතකදී මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීමට කටයුතු කර ලද අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ පෞද්ගලික අංශයට ලබාදෙන ණය ප්‍රමාණය සැළකිය යුතු මට්ටමකින් අඩුවී ඇති බව වාර්තා වීමයි. මේ අනුව, ප්‍රතිපත්තිමය පොලී අනුපාත අඩු කිරීමට මෙන්ම ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු මත අයකෙරෙන දඩ පොලී අනුපාතය අඩු කිරීමට ද මහ බැංකුව විසින් පියවර ගන්නා ලදී.

එකී පියවර හේතුවෙන් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතයන් අඩුවීමක් මෙන්ම විවට වෙළෙඳපොළ අනුපාත ඇතුලු වෙනත් මූල්‍ය වෙළෙඳපොළ අනුපාතයන් පහත වැටීමක් ද සිදුවිය.

මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම ණය අනුපාතයන් අඩුවීමකට හේතුවූවා සේම එමගින් පුද්ගලික අංශයේ ණය දීම්වලට දිරිදීමක් ද විය. ආර්ථිකයේ වර්ධනීය අපේක්ෂාවන් පුළුල් කිරීමටත්, ආර්ථිකමය ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීමටත් බැංකු මගින් සිය සේවාදායකයන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම වැදගත් වේ.

ඒ අනුව, අයකරනු ලබන පොලී අනුපාතයන් අඩුකිරීම සඳහා යෝග්‍ය පියවර ගන්නා මෙන් මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දී ඇත.

2. 2009 මාර්තු මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය

අපනයනයන්ට වඩා වැඩි වේගයකින් ආනයන අඛණ්ඩව අඩුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2009 මාර්තු මාසයේදී වෙළෙඳ හිඟය නොකඩවා තෙවැනි වරටත් පහළ ගියේය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2009 මාර්තු මාසයේ වෙළෙඳ හිඟය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 383 ක් දක්වා සියයට 17.6 කින් අඩු විය. 2008 වසරේ පළමු කාර්තුව තුළ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,401 ක් වූ සමුච්චිත වෙළෙඳ හිඟය, 2009 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 645 ක් ලෙස සියයට 54.0 කින් පහත වැටුණි. පෞද්ගලික ප්‍රේෂණ මෙතෙක් පැවැති ඉහළම අගය 2009 මාර්තු මාසය තුළදී වාර්තා කළ අතර, එය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 278 ක් විය. 2008 වසරේ පළමු කාර්තුව තුළදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 787 ක් වූ පෞද්ගලික ප්‍රේෂණයන් සමග සසඳන විට 2009 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී පෞද්ගලික ප්‍රේෂණ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 774 ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පළමු කාර්තුව තුළදී ලැබූ පෞද්ගලික ප්‍රේෂණ, වෙළෙඳ හිඟයට වඩා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 129 ක් (සියයට 20 ක් පමණ) ඉක්මවන ලදී.

පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2009 මාර්තු මාසයේ අපනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 627 ක් දක්වා සියයට 7.8 කින් පහත වැටුණු අතර මේ සඳහා කාර්මික අපනයන මූලික විය. කෙසේ වුවත්, ගෝලීය ආර්ථික අර්බුදයේ අයහපත් බලපෑම හමුවේ වුවද, ශ්‍රී ලංකාවේ අපනයනයන්ගෙන් සියයට 50 කට පමණ දායකත්වයක් ලබාදෙන රෙදිපිළි හා ඇඟළුම්වල මාසික අපනයන අඛණ්ඩව තෙවැනි වරටත් වර්ධනයක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් රජය සහ ඇඟළුම් කර්මාන්තය විසින් ගෝලීය ආර්ථික ප්‍රතිවිපාකයනට මුහුණදීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් හේතුවෙන් රෙදිපිළි හා ඇඟළුම් අපනයන 2009 මාර්තු මාසයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 310 දක්වා සියයට 6.0 කින් වර්ධනය විය. 2009 මාර්තු මාසය තුළදී යුරෝපා සංගමයට කරන ලද රෙදිපිළි හා ඇඟළුම් අපනයන සියයට 18.4 කින් වර්ධනය වූ අතර, ඇමෙරිකා එක්සත් ජනපදයට කරන ලද රෙදිපිළි හා ඇඟළුම් අපනයන සියයට 4.5 කින් පහත වැටුණි. ආහාර, පාන හා දුම්කොළ අපනයන ද ඉහළ ගොස්

ඇති අතර, රබර් ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු අනෙකුත් උප කාණ්ඩයන් පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන විට මෙම කාලය තුළදී පහත වැටීමක් පෙන්නුම් කර ඇත. පසුගිය මාස හතර පුරා අඛණ්ඩව පහත වැටුණු කෘෂිකාර්මික අපනයනයන් 2009 මාර්තු මාසය වන විට පෙර වර්ෂයේ අනුරූප මාසය සමඟ සැසඳීමේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 154 දක්වා ආන්තික වර්ධනයක් වාර්තා කර ඇති අතර මේ සඳහා තේ සහ පොල් අපනයන මූලික වී ඇත. පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන විට 2009 මාර්තු මාසයේ තේ, රබර් සහ පොල් අපනයන පරිමාව ඉහළ ගිය අතර, පසුගිය මාසයට වඩා මාර්තු මාසයේ දී තේ මිල ගණන් ඉහළ යන ලදී. කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් ලෝකයේ අනෙකුත් ප්‍රධාන වෙන්දේසි මධ්‍යස්ථාන අතුරින් ඉහළම ස්ථානයේ රඳවාගැනීමට හැකි විය. 2008 වසරේ පළමු කාර්තුව තුළදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,878 ක් වූ සමුච්චිත අපනයන ආදායම 2009 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,642 දක්වා සියයට 12.6 කින් පහත වැටුණි.

මේ අතරම, පාරිභෝගික භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ ආනයන සඳහා වූ ඉල්ලුම අඩුවීම හේතුවෙන්, 2009 මාර්තු මාසය සඳහා වූ ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,009 ක් දක්වා සියයට 11.8 ක, සාපේක්ෂව ඉහළ අනුපාතයකින් අඩු විය. 2009 මාර්තු මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 209 දක්වා සියයට 24.3 කින් පහත වැටුණි. ප්‍රධාන ආහාරමය භාණ්ඩ ආනයන අතුරින් සහල්, තිරිඟු සහ කිරි පිටි සඳහා වූ වියදම පහත වැටුණු අතර මෙම කාලපරිච්ඡේදය තුළදී සීනි සඳහා වූ සාමාන්‍ය ආනයනික මිලෙහි සියයට 22.4 ක ඉහළයාමක් පිළිබිඹු කරමින් සීනි ආනයන වියදම ඉහළ ගියේය. සීනි නිෂ්පාදනය කරනු ලබන ඇතැම් ප්‍රධාන රටවල අඩු නිෂ්පාදනය හමුවේ ලොව පුරා සීනි සැපයුම අඩුවීම නිසා මෑත කාලය තුළදී සීනි සඳහා වන ජාත්‍යන්තර මිල ගණන් ඉහළ ගියේය. 2009 මාර්තු මාසයේ දී ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන අතුරින් මෝටර් රථ ආනයන වියදම සියයට 65 කින් පහත වැටුණු අතර, ගෘහස්ථ විදුලි උපකරණ සඳහා වූ වියදම ද පහත වැටුණි. 2009 මාර්තු මාසයේ දී අන්තර් භාණ්ඩ වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 475 දක්වා සියයට 23.8 කින් පහත වැටුණු අතර, මේ සඳහා අන්තර් භාණ්ඩ වලින් සියයට 40 ක් පමණ වූ ඛනිජ තෙල් ආනයන දායක විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බොරතෙල් බැරලයක මිල අඛණ්ඩව එ.ජ.ඩොලර් 47 ක පමණ අගයක පැවැතීමය. පොහොර මිල සියයට 31.8 කින් පහත වැටීම සහ යල කන්නය සඳහා අවශ්‍ය කරනු ලබන පොහොර මේ වන විටත් ආනයනය කර තිබීම හේතුවෙන්, පොහොර ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 9 දක්වා සියයට 62.9 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. එහෙත්, ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදමෙහි සැලකිය යුතු ඉහළයාම හේතුවෙන් 2009 මාර්තු මාසයේ දී ආයෝජන භාණ්ඩ වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 312 දක්වා සියයට 29.5 කින් වර්ධනය විය. ආයෝජන භාණ්ඩ ආනයනයන්ගේ සැලකිය යුතු වර්ධනය නුදුරු අනාගතයේ දී ආර්ථික වර්ධනය සීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත්වීම පෙන්වන පෙර දර්ශකයක් වේ. 2009 මාර්තු මාසය අවසන් වන විට සමුච්චිත ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,287 ක් දක්වා සියයට 30.3 කින් පහත වැටුණි.

2009 මාර්තු මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) අරමුදල් සහිතව සහ රහිතව පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,373 හා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,272 ලෙස වාර්තා විය. විදේශීය විනිමය වෙළෙඳපොළෙහි අනවශ්‍ය පීඩනයක් ඇති නොවී ඛනිජ තෙල් ආනයන වියදම් පියවීමේ අරමුණින් දේශීය බැංකු දෙකක තැන්පත් කරන ලද එ.ජ.ඩොලර් දශ ලක්ෂ 200 ක විදේශ විනිමය තැන්පතු ද මේ තුළ ඇතුළත් වේ. පසුගිය මාස දොළහ තුළදී මාසයකට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,085 ක් වූ සාමාන්‍ය ආනයනයන්ට අනුව මෙම සංචිත අගයන් පිළිවෙලින් මාස 1.3 ක සහ 1.2 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් වේ. කෙසේ වුවත්, ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන වියදමෙහි තියුණු අඩුවීමෙන් දැනට පවත්නා සහ අපේක්ෂිත ආනයන මිල පහළයාම හේතු කොටගෙන සැබෑ වශයෙන්ම මූල්‍යනය කළහැකි ආනයනික මාස ගණන් මීට වඩා වැඩි වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ කිසිදු මැදිහත්වීමකින් තොරව විදේශීය විනිමය වෙළෙඳපොළ තුළ මෑතකාලයෙහි රුපියලෙහි සිදුවූ අධිප්‍රමාණය ඉහළ විදේශ විනිමය ගලාඒම් සහතික කරනු ලබයි. දශක තුනක් තිස්සේ පැවති යුද්ධය අවසන් වීමෙන් ඇති වූ සුභවාදී ඉදිරි දැක්මත් සමඟ මෙම විදේශ විනිමය ගලාඒම් අනාගතයේදීත් අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි. නිල සංචිත සතුටුදායක මට්ටමක් දක්වා ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මේ වනවිට වඩා යහපත් ස්ථානයක සිටී.

මෙම කාලපරිච්ඡේදය සඳහා විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය පහත සඳහන් සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරීත්වය - 2009 මාර්තු සහ 2009 ජනවාරි - මාර්තු

	2008 මාර්තු එ.ජ.ඩො. දශ ලක්ෂ	2009 මාර්තු එ.ජ.ඩො. දශ ලක්ෂ	මාර්තු වර්ධනය %	2008 ජන: සිට මාර්තු එ.ජ.ඩො. දශ ලක්ෂ	2009 ජන: සිට මාර්තු එ.ජ.ඩො. දශ ලක්ෂ	ජන: සිට මාර්තු වර්ධනය %
අපනයන	**680.2**	**626.8**	**-7.8**	**1,878.1**	**1,642.2**	**-12.6**
මෙයින් කෘෂිකාර්මික	153.1	153.7	0.4	444.5	363.3	-18.3
මෙයින් තේ	106.5	108.4	1.8	306.0	242.3	-20.8
කාර්මික	516.5	466.7	-9.6	1,393.1	1,259.5	-9.6
මෙයින් රෙදිපිළි හා ඇඟළුම්	293.0	310.5	6.0	780.4	826.2	5.9
ඛනිජ ද්‍රව්‍ය	10.6	6.4	-39.2	40.2	19.4	-51.9
ආනයන	**1,144.4**	**1,009.3**	**-11.8**	**3,279.4**	**2,286.8**	**-30.3**
මෙයින් පාරිභෝගික භාණ්ඩ	275.8	208.7	-24.3	689.4	504.5	-26.8
අන්තර් භාණ්ඩ	623.2	474.6	-23.8	1,786.6	1,097.1	-38.6
මෙයින් ඛනිජ තෙල්	263.5	187.4	-28.9	732.0	363.3	-50.4
ආයෝජන භාණ්ඩ	240.9	311.8	29.5	785.6	653.4	-16.8
වෙළෙඳ ශේෂය	**-464.3**	**-382.5**	**-17.6**	**-1,401.3**	**-644.6**	**-54.0**
පෞද්ගලික ප්‍රේෂණ	**264.3**	**278.5**	**5.4**	**787.0**	**773.6**	**-1.7**

මූලය :- ශ්‍රී ලංකා මහ බැංකුව

3. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2009 මැයි

ශ්‍රී ලංකාව වඩාත් ශුභවාදී බලාපොරොත්තු තබාගත හැකි එහෙත් ආර්ථික වශයෙන් අභියෝගාත්මක කාල වකවානුවකට පිවිසෙමින් සිටී. ගෝලීය ආර්ථික පසු බැස්ම හමුවේ 2009 වසරේ ආර්ථික වර්ධනය පිළිබඳව කලින් පැවති අශුභවාදී ප්‍රවණතාවයන් යටපත් වෙමින් ආර්ථික වර්ධනය පිළිබඳ අපේක්ෂාවන් වඩාත් උද්දීපනය වී තිබේ. අලුතින් මුදවාගත් ප්‍රදේශවල සිදු කිරීමට නියමිත ප්‍රතිසංස්කරණ හා සංවර්ධන කටයුතු සමඟ වැඩි වන දේශීය ඉල්ලුම දේශීය නිෂ්පාදිතය ඉහළ නැංවීමටත් මෙරට නිමවුම වැඩි කිරීමටත් දායක වනු ඇත.

පසුගිය දින කිහිපය පුරා රුපියල අධි ප්‍රමාණය වීමත් සමඟ විදේශ විනිමය වෙළෙඳපොළ ද ස්ථායී වී ඇති බව පෙනී යයි. උද්ධමනයේ අඛණ්ඩ පහත බැසීමත් නාමික විනිමය අනුපාතයෙහි පවතින නම්‍යශීලීත්වයත් හේතුකොට ගෙන මූර්ත විනිමය අනුපාතය අවප්‍රමාණය වී ඇති අතර මේ තුළින් රටෙහි විදේශ වෙළෙඳාමෙහි තරගකාරීත්වය වර්ධනය වී ඇත. 2009 පළමු කාර්තුව තුළ පෞද්ගලික ප්‍රේෂණ ලැබීම් එම කාලපරිච්ඡේදය තුළ පැවැති වෙළෙඳ හිඟයට වඩා ඉහළ අගයක් ගත් අතර, ඇඟලුම් හා තේ වැනි ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වැඩි දියුණුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (පාදක වර්ෂය= 2002) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනයෙහි පහත වැටීමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2009 අප්‍රේල් මස උද්ධමනය සියයට 2.9 දක්වා අඩු වූ අතර, එහි මෙතෙක් වාර්තා කරන ලද අවම අගය ද මෙය වේ. මුදල් සැපයුමෙහි වර්ධනය ද යහපත් මට්ටමක පවතී. මෙයට අමතරව විදේශීයව උද්ගත වන මිල පීඩනයන් ද අවම මට්ටමක පවතී. මේ හේතුවෙන් දේශීය උද්ධමන අපේක්ෂාවන් හිතකර මට්ටමක පවතී. ඉදිරි මාස දෙක ඇතුළත වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය අවම මට්ටමකට පත්වීමෙන් පසුව 2009 හා 2010 තුළ තනි අගයක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත.

ඉහත පවසන ලද වර්ධනයන් මෙන්ම අඩු පොලී අනුපාතිකවලට ණය ලබාදීම තුළින් ආර්ථික කටයුතුවලට තව දුරටත් සහාය ලබාදීමේ අරමුණෙන් මුදල් මණ්ඩලය විසින් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තව දුරටත් ලිහිල් කිරීමට තීරණය කර ඇත. මේ අනුව (1) මහ බැංකුව සමඟ සිදු කරන ප්‍රතිවිකුණුම් ගනුදෙනු මත පනවා තිබූ දඬ පොලී අනුපාතිකය ඉවත් කිරීමට (2) ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 11.50 දක්වා පදනම් අංක 25 කින් අඩු කිරීමට (3) ප්‍රතිවිකුණුම් අනුපාතිකය යටතේ මහ බැංකුවෙහි ප්‍රතිවිකුණුම් නිත්‍ය පහසුකමින් අරමුදල් ලබා ගැනීමේ වාර ගණන මත සහභාගිත්ව ආයතන වෙත පනවා තිබූ සීමාවන් ඉවත් කිරීමට, හා (4) ප්‍රතිමිලදී ගැනුම් නිත්‍ය පහසුකම යටතේ සහභාගිත්ව ආයතනයක් විසින් මහ බැංකුවෙහි තැන්පත් කළහැකි උපරිම තැන්පතු සීමාව ඉවත් කිරීමට තීරණය කර ඇත. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වහාම බලපැවැත්වෙනු ඇත. මෙම සීමාවන් ඉවත් කිරීමත් සමගම, ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතිකවලින් සැදුම්ලත් කොරිඩෝව තුළ අන්තර් බැංකු පොලී අනුපාතික ස්ථාවරව පවත්වා ගැනීම සඳහා තම මුදල් ප්‍රතිපත්ති කටයුතු සිදු කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවය සුරක්ෂිත කර ගැනීමට මහ බැංකුව විසින් ගන්නා ලද පියවරවලට ප්‍රතිචාර ලෙස වෙළෙඳපොළ පොලී අනුපාතික ද පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත. මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තව දුරටත් ලිහිල් කිරීම වෙළෙඳපොළ පොලී අනුපාතික තව දුරටත් පහත වැටීමට දායක වනු ඇතැයි ද මේ තුළින් ණය ගැනීමේ පිරිවැය පහත වැටීමෙන් ආර්ථික කටයුතු ප්‍රවර්ධනය වනු ඇතැයි ද අපේක්ෂිතය.

මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මීළඟ ප්‍රකාශය 2009 ජූනි මස 17 වන දින නිකුත් කෙරෙනු ඇත.

4. S&P ආයතනය විසින් ශ්‍රී ලංකාවේ දැක්ම සඳහා වූ ශ්‍රේණිගත කිරීම පහළ දැමීමට ගත් තීරණය කණගාටුදායක වේ

2009.05.21 දින සිට ශ්‍රී ලංකාවේ දැක්ම සඳහා වූ ශ්‍රේණිගත කිරීම "ස්ථාවර" මට්ටමේ සිට "සෘණාත්මක" මට්ටම දක්වා පහත දැමීමට ගත් අසාධාරණ තීරණය පිළිබඳව ශ්‍රී ලංකා බලධාරීන් සිය විමතිය පළකරයි. විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවේ දැනට සිදුවෙමින් පවතින සතුටුදායක සංවර්ධන ක්‍රියාමාර්ග දෙස බලන කල්හි මෙම ආයතනය විසින් නිකුත් කළ වාර්තාවේ සඳහන් කරණු අපකීර්තිය දනවන අත්තනෝමතික සහ පක්ෂග්‍රාහී වන බව ශ්‍රී ලංකා බලධාරීන්ගේ මතයයි. ඒ අනුව බලන කළ, මෙම ආයතනයේ වාර්තාව ශ්‍රී ලංකා බලධාරීන් විසින් තරයේ ප්‍රතික්ෂේප කරනු ලබයි.

ත්‍රස්තවාදයට එරෙහිව ලබාගත් ජයග්‍රහණයත් සමඟ පසුගිය දින කිහිපය තුළදී සාමාන්‍යයෙන් ලැබෙන ප්‍රමාණයට වඩා වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් අප රට වෙත ගලා ආවේය. එසේම, මෙම වසරේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වෙළෙඳ ගිණුමේ හිඟය ඉක්මවාලීමට සමත් විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ඉහළම අගය 2009 මාර්තු මාසය තුළදී වාර්තා විය. තවද, පසුගිය දින කිහිපයේ දී කොටස් වෙළෙඳපොළ ලැබීම් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, මෙය සියලුම කොටස් වෙළෙඳපොළ මිල දර්ශකයන් හි සීඝ්‍ර වර්ධනයට හේතු විය. විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් සහ අනෙකුත් විදේශීය ආයෝජකයන් විසින් ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජනය කිරීම වර්ධනය වීම නිසා මෑත කාලයේ දී ආර්ථිකය පිළිබඳව ව්‍යාපාරික විශ්වාසය සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, දින කිහිපයකට පෙර එ.ජ.ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය රු.120/- මට්ටමේ සිට රු.115/- දක්වා අධිප්‍රමාණය විය. ඒ අනුව, දේශීය තරගකාරිත්වය වර්ධනය කිරීම සඳහා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය සැලකිය යුතු ප්‍රමාණයක් මහ බැංකුව විසින් අවශෝෂණය කරගැනීම හේතුවෙන් මහ බැංකුවේ සංචිත සීඝ්‍රයෙන් ඉහළ ගියේය. මීට අමතරව, මහ බැංකුව විසින් සිය මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සහ විදේශ විනිමය ලැබීම් නිසා දේශීය පොලී අනුපාතිකයන් අඩු වී, පෞද්ගලික අංශයේ ණය වැඩිවන්නට පටන් ගෙන ඇත. මෙම වාසිදායක පසුබිම මත, ජාත්‍යන්තර ආයෝජකයින් විසින් ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව සිය විශ්වාසය නැවත සනාථ කර ඇති අතර, පසුගිය දින කිහිපය පුරා ශ්‍රී ලංකා ස්වෛරීත්ව බැඳුම්කරයෙහි විකුණුම් මිල සහ ගැණුම් මිල අතර වෙනස පදනම් අගයන් 500 ද ඉක්මවා අඩුවී ඇත.

මෙවැනි සියලුම ධනාත්මක ප්‍රවණතා සහ ලක්ෂණ S&P ආයතනය විසින් නොදැක සිටීම පුදුම සහගතය. සිය වාර්තාව තුළින් ඉදිරියේ දී ශ්‍රී ලංකා රුපියලේ විය හැකි අවප්‍රමාණය පුරෝකථනය කිරීමේ දී S&P ආයතනය ගෙන ඇති ඉතා අවාසිදායක ස්ථාවරය ද පුදුම සහගතය. මෙවැනි විෂය මූලික කරුණු ගැන පදනම් නොවූ සහ අත්තනෝමතික මතයන් සත්‍ය වශයෙන්ම වෘත්තීමය මට්ටමේ ප්‍රකාශන නොවේ. මෙරට ආර්ථිකය පිළිබඳ සැබෑ තත්ත්වයන් S&P ආයතනය විසින් අවබෝධ කර නොගෙන සිටීම හෝ කිසියම් පීඩනයක් යටතේ ක්‍රියා කිරීම මෙවැනි මතයන්ට හේතුවිය හැකිය. ශ්‍රී ලංකාවට ලබාදීමට නියමිත සම්පස්ථ ණය පහසුකම සම්මත කිරීමට කටයුතු කෙරීගෙන යන බව ජා.මූ.අ. ලේ ප්‍රධානීන් දන්වා තිබිය දීත්, S&P ආයතනය විසින් ශ්‍රී ලංකාවේ දැක්ම පිළිබඳ ශ්‍රේණිගත කිරීම පහළ දැමීමට ගත් තීරණය පුදුම සහගතය.

අතීතයේ දී පවා S&P ආයතනයේ වාර්තාවන් පක්ෂග්‍රාහී වූ අවස්ථාවන් පිළිබඳ ශ්‍රී ලංකා බලධාරීන් විසින් දක්වා ඇත. ශ්‍රී ලංකා ආර්ථිකයේ ධනාත්මක වර්ධනයන් සැලකිල්ලට භාජනය කිරීමට S&P ආයතනය බොහෝ අවස්ථාවන්හි දී සිය අකමැත්ත පැහැදිලිව ප්‍රදර්ශනය කොට ඇත. මේ හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ණය පිළිබඳව අපක්ෂපාතී සහ වෘත්තීමය විනිශ්චයක් ලබාදීමට එම ආයතනයට ඇති හැකියාව පිළිබඳ සැක සංකා මතුවේ. එම නිසා, මෙම ශ්‍රේණිගත කිරීමේ ආයතනය සමඟ ඇති සම්බන්ධතාවය නැවත සලකා බැලීමට ශ්‍රී ලංකා බලධාරීන්ට සිදුවී ඇත. ශ්‍රී ලංකා ණය ව්‍යුහය පිළිබඳ දැනට ඇති සහ නැගී එන ධනාත්මක ලකෂණයන්, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ආයෝජකයන් සහ පාර්ශ්වකරුවන් වෙත සෘජුව සන්නිවේදනය කිරීමට ශ්‍රී ලංකා බලධාරීන් විසින් පියවර ගැනීම තුළින් S&P ආයතනයේ අත්තනෝමතික වාර්තාවෙන් ඇති කළ සෘණාත්මක අදහස්වලට මනා පිළිතුරක් ලබාදෙනු ඇත.

5. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)
2007, 2008 සහ 2009

2002= 100)

මාසය	දර්ශකය			මාසික වෙනස්වීම %			ලක්ෂ්‍යමය වෙනස්වීම %			වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම %		
	2007	2008	2009	2007	2008	2009	2007	2008	2009	2007	2008	2009
ජනවාරි	151.8	183.5	203.1	1.3	3.0	-0.3	13.7	20.8	10.7	10.6	16.4	21.6
පෙබරවාරි	155.2	188.6	202.9	2.2	2.8	-0.1	15.2	21.6	7.6	11.1	17.0	20.3
මාර්තු	155.0	191.9	202.0	-0.1	1.7	-0.4	15.1	23.8	5.3	11.7	17.7	18.6
අප්‍රේල්	156.3	195.4	201.0	0.8	1.8	-0.5	14.3	25.0	2.9	12.3	18.7	16.7
මැයි	157.3	198.5	205.1	0.6	1.6	2.0	13.2	26.2	3.3	12.6	19.8	14.7
ජූනි	160.6	205.9		2.1	3.7		13.5	28.2		12.8	21.0	
ජූලි	163.1	206.4		1.6	0.2		15.4	26.6		13.3	21.9	
අගෝස්තු	165.2	206.3		1.3	0.0		16.5	24.9		13.8	22.6	
සැප්තැම්බර්	166.7	207.2		0.9	0.4		16.1	24.3		14.2	23.2	
ඔක්තෝබර්	171.8	206.6		3.0	-0.3		18.2	20.2		14.8	23.4	
නොවැම්බර්	176.4	205.2		2.7	-0.7		19.3	16.3		15.4	23.0	
දෙසැම්බර්	178.1	203.7		1.0	-0.7		18.8	14.4		15.8	22.6	

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව